18 වන පිටෙන්

වහලින් පහළට හිම කුරු එල්ලෙමින් තිබුණේ කඩු වගේ. හැමකෙනාම උණුසුම් ලොම් කබා පැළඳගෙන එහා මෙහා ගියා, පුංචි ළමුන් රතු තොප්පි පැළඳගෙන හිම ක්‍රීඩා කළා.

අසරණ පුංචි ලිහිණියාට එන්න එන්නම සීතල වැඩිවුණා. එහෙත් ඔහු කුමාරයාට බෙහෙවින්ම ආදරය කළ නිසා ඔහුව අත්හැර යන්නට සූදානමක් තිබුණේ නැහැ. බේකරි හිමියාගේ අවධානය වෙනතක තිබෙන වේලාවලදී ඔහු බේකරිය අසල වැටී තිබුණු පාන් රොඩු ආහාරයට ගත්තා. අත්තටු ගසමින් සිරුර උණුසුම්ව තබාගන්නට උත්සාහ කළා.

එහෙත් අන්තිමේදී තමන් මියයන්නට නියමිත බව ඔහුට වැටහුණා. කුමාරයාගේ උරහිසට පියාසර කරන්නට ඔහුට ශක්තිය තිබුණේ යන්තමින්. "ආයුබෝවන් ආදරණීය කුමාරයා!'' ඔහු මිමිනුවා, "මට ඉඩ දෙනවාද ඔබේ අත සිපගන්නට?''

"ඔබ අවසානයේදී ඊජිප්තුවට යන්නට සූදානම් වීම ගැන මට සතුටුයි පුංචි ලිහිණියෝ'' කුමාරයා කීවා "ඔබ මෙහි සිටියා කල් වැඩියි. මම ඔබට ආදරේ නිසා මගේ දෙතොලට හාදුවක් දෙන්න''

"මම යන්නේ ඊජිප්තුවට නෙමෙයි,'' ලිහිණියා කීවා. "මම යන්නේ මරණයේ නිවසට. මරණය නින්දේ සොහොයුරා නොවේද?''

එසේ කියා ඔහු ප්‍රීතිමත් කුමාරයාගේ දෙතොල් මත හාදුවක් තබා ඔහුගේ දෙපා පාමුල මැරී වැටුණා.

ඒ මොහොතේම පිළිමය තුළින් අමුතුම ඉරිතැලුම් හඬක් ඇසුණා, හරියට යමක් බිඳී ගියා වැනි හඬක්. ඇත්තටම සිදුවී තිබුණේ පිළිමයේ ඊයම් හදවත හරියටම දෙකට පැළී යාමයි. ඇත්තෙන්ම එය බොහොම දරුණු සීත කාලයක්.

පසුදා උදෑසනින්ම නගරයේ නගරාධිපති නගර සභාවේ නිලධාරීන් දෙදෙනෙක් සමඟ චතුරශ්‍රයේ ඇවිදිමින් සිටියා. ඔවුන් කුලුන පසුකර යද්දී ඔහු පිළිමය දෙස හිස ඔසවා බැලුවා. "අයියෝ, ප්‍රීතිමත් කුමාරයා මහා කසිකබල් පාටයි!'' ඔහු කීවා.

"ඇත්තටම කසිකබල් පාටයි!'' නිතරම නගරාධිපති කියන දේට එකඟ වෙන නිලධාරීන් දෙදෙනාත් කීවා. එසේ කියා ඔවුන් පිළිමය වඩාත් හොඳින් දැක බලාගන්නට එය කිට්ටුවට ගියා.

"කඩුවේ තිබුණු රත් මැණික හැලී ගිහින්, ඔහුගේ ඇස් දෙකම නැහැ, ඒ මදිවට ඔහුගේ රත්තරන් පාටත් මැකිලා ගිහින්,'' නගරාධිපති කීවා. "ඔහු දැන් හිඟන්නකුට වඩා ටිකයි හොඳ!''

"හිඟන්නකුට වඩා ටිකයි හොඳ!'' නගර සභා නිලධාරීන් ද කීවා.

"ඔහුගේ දෙපා මුල මැරුණු කුරුල්ලෙක් පවා ඉන්නවා!'' නගරාධිපති තවදුරටත් කීවා. "අපි ඇත්තටම ප්‍රකාශයක් නිකුත් කරන්න ඕන කුරුල්ලන්ට මෙතැන මැරෙන්න තහනම් බවට.'' නාගරික ලිපිකරුවා මේ යෝජනාව සටහන් කරගත්තා.

ඉතින් ඔවුන් ප්‍රීතිමත් කුමාරයාගේ පිළිමය කඩා දැමුවා. "ඔහු තවදුරටත් අලංකාර නැති නිසා ඔහු තවදුරටත් ප්‍රයෝජනවත් නැහැ,'' සරසවියේ කලාව පිළිබඳ මහාචාර්යවරයා කීවා.

ඔවුන් පිළිමය උදුනක ලා උණු කළ අතර ඒ ලෝහයෙන් කුමක් තැනිය යුතුදැයි තීරණය කරන්නට නගරාධිපති විසින් නිලධාරීන් රැස් කර රැස්වීමක් පැවැත්වූවා. "අපි අනිවාර්යයෙන්ම තව පිළිමයක් තැනිය යුතුයි,'' ඔහු කීවා, "එය මගේ පිළිමයක් විය යුතුයි.''

"මගේ පිළිමයක්'' නගර සභා නිලධාරීන් හැම දෙනාම කියා ඔවුන් බහින් බස් වන්නට ගත්තා. මම ඔවුන්ව අන්තිමට දකිද්දීත් ඔවුන් බහින්බස් වෙමිනුයි උන්නේ.

"මේක නම් හරිම පුදුමයක්!'' වාත්තු වැඩපොළේ ප්‍රධානියා තමන්ගේ සේවකයන්ට කීවා. "මේ බිඳුණු ඊයම් හදවත උදුනේ ලෑවත් උණු වෙන්නේ නැහැ. අපිට ඒක ඉවතලන්නට වෙනවා.'' ඉතින් ඔවුන් එය මැරුණු ලිහිණියා වීසි කර දමා තිබුණු කුණුගොඩටම එයත් වීසිකළා.

"නගරයේ ඇති වටිනාම දේවල් දෙක මට ගෙනැවිත් දෙන්න,'' දෙවියන් ඔහුගේ සුර දූතයෙකුට කීවා. සුර දූතයා ඊයම් හදවතත්, මියඇදුණු කුරුල්ලාත් දෙවියන් වෙත ගෙනැවිත් දුන්නා.

"ඔබ හරියටම තෝරාගෙන,'' දෙවියන් කීවා. "මගේ පාරාදීස උයනේ මේ පුංචි කුරුල්ලා සදාකාලිකව ගී ගයාවි, ප්‍රීතිමත් කුමාරයා මගේ රන් නගරයේ වෙසෙමින් මට ප්‍රශංසා කරාවි.''




